# ලොව දසතම ඇත්තෙත් නැති නැත්තෙත් නැති ජලය

ප්‍රවෘත්ති ප්‍රකාශන නිලධාරි
**යසසිරි ජනක කුමාර විසිනි**

ජල සමුළු ලාංඡනය

**ස්වභාවධර්මය ලොවට දී ඇති උසස්ම දයාදය ජලයයි. උසස්ම වස්තුව මිනිසා ලෙස මිනිසා විසින්ම හඳුනා ගත්තත් ජලය නොමැතිව ඔහුට ජීවත් වෙන්න බැහැ. මිනිස් ජීවිතය ජලය මත කොතරම් රැඳී ඇත්දැයි කියතොත් එක් විද්‍යාඥයෙක් 'මිනිසා ඇවිදින මුහුදු වතුර ගෝනියක්' ලෙස හැඳින්නු වේ මිනිස් සිරුරේ ජල ප්‍රමාණය ගැනත් ඉඟි කරමින්.**

මිනිස් සංහතියේ පරම්පරාවන්ගෙන් අපි ඉතා ආශ්වර්යමත් යුගයට හිමිකම් කියමු. අනාදිමත් කාලයක් පොළොව මත සිට සඳ පායනු බලා සිටි මිනිසාට සඳ මත සිට 'මිහිකත පායනු' බැලීමේ මහිමය ලබා දුන්නේත් අපේ පරම්පරාවයි. මෙවැනි පෙරළි කරන මිනිසාගේ ජීවන පදනම වන ජලයත් හරිම පෙරළි කාරයෙක්.

ලොවේ ජනගහණය දිනෙන් දින වැඩි වුනත් ජල සම්පත වෙනස් නොවන්නක්. අනෙක් ස්වභාවික සම්පත් අඩු වැඩි වුනත් ලෝක ජල ධාරිතාව අඩු වැඩි කළ හැක්කක් නොවේ. රුසියානු විද්‍යාඥයන් පිරිසකගේ අධ්‍යයනයකට අනුව ලෝක ජලයෙන් 96.5% ක්ම මුහුදු ජලයයි. මිනිසාගේ ජීවන පැවැත්මට මිරිදිය සපයන දිය ඇලි ගංගා, වැව්, පොකුණු, හිම ශිඛර හා පොළෝ ජලය ලෙසින් ඇත්තේ ඉතිරි 3.5%ක් පමණයි. මින් වැඩි ප්‍රමාණයක් දියර තත්ත්වයේ නොව ඝන තත්ත්වයේ පවතින්නේ. ග්‍රීන්ලන්තය, ඇන්ටාර්ටික් හා ආර්ටික් ප්‍රදේශවල යෝධ හිම ශිඛර හා හිම තට්ටු ලෙසයි මෙම ජලය තියෙන්නේ.

අනාදිමත් කාලයක ඉඳලා ජලය මිනිස් ක්‍රියාවලි හා එක්වෙලා. පුරාණයේ ගම්මාන හැදුනේ ජල පහසුව අනුවයි. ඉන්දු, නයිල් හා ඇමෝසන් නදී ශිෂ්ඨාචාර ඉපැරණි වාරි මාර්ග ක්‍රමවල ඉතිහාසය දනුදු පෙන්වනවා. එකල ජලය ප්‍රශ්නයක් වුනේ නැහැ. ජලය ජීවන උල්පත වුනා.

සංවර්ධනයට අදාළව බලනවිට ගෙදර දොරේ කටයුතුවලට මෙන්ම ගොවිතැන් හා කර්මාන්තවලටත් ජලය අවශ්‍යයයි. බීමට හා ගෙදර දොරේ භාවිතයට පිරිසිදු ජලය නොමැතිවීම ලොව පුරා විශේෂයෙන්ම දියුණු වන රටවල් මුහුණ පා ඇති බරපතල ප්‍රශ්නයක්. ලෝක සෞඛ්‍ය සංවිධානය කළ සමීක්ෂණයකට අනුව රටවල් 90 ක ජනගහණයෙන් 72% ක්ම ගැමියන්. එහෙත් ඔවුන්ගෙන් පිරිසිදු ජලය ලැබෙන්නේ 14% කට පමණයි. ලෝක ජනගහණයෙන් 55.1% වෙසෙන ඇත පෙරදිග හා ආසියානු රටවල පිරිසිදු ජලය නොලැබෙන ජනතාවගේ ප්‍රමාණය දශ ලක්ෂ 632. රටක ප්‍රධාන සම්පත මිනිස් සම්පත හෙයින් ඔවුනට පිරිසිදු ජලය සැපයීම අද ප්‍රධාන ප්‍රශ්නයක් වෙලා.

ලෝක ජල තත්ත්වයත් වර්තමාන ලෝකයේ ස්වභාවික සම්පත් බෙදීමේ රටාව පැහැදිලි කරන්නක්. ඇත්තා තර වන අතර නැත්තාට නැති වීම ජල සම්පාදනයේදීත් පැහැදිලිව ඇත. ලෝකයටම සරිලන තරම් ජලය ස්වභාව ධර්මයා විසින් දී ඇතත් එය බෙදී යන්නේ අසාධාරණ අන්දමිනි. ඇතැම් පෙදෙස්වල ස්වභාවික ජල හිභයක් තිබුනද, ඇත්තාට තම නිවෙස් නාන කාමර, නාන තටාක පවා සාදා ගත හැක. එහෙත් දුක්පත් කාන්තාවන්ට ජලය සොයා සැතපුම් ගණන් ඇවිදීමට වීම අද ද ලොව සාමාන්‍ය දර්ශනයක්.

වත්මන් ලෝක ජල සැපයුම් වලින් වැඩි ප්‍රමාණය වැය වන්නේ ගොවිතැන් සඳහායි. දනට මේ සඳහා ජල සැපයුම වසරකට ඝන කිලෝ මීටර 2,100 කි. රටක ජල

සැපයුමෙන් 80% ක් පමණ ගොවිතැන් සඳහායි යොදවන්නේ. එහෙත් ලෝක ගොවි බිම් වලින් වාරි ජලය සැපයෙන්නේ 18% කට පමණි. ලෝක ආහාර සැපයුමෙන් 50% ක් ලැබෙනුයේ මෙම බිම් වලින්. ශත වර්ෂය අවසානයේ වැඩි වන ජනගහණය සඳහා ආහාර සැපයුමද වැඩි කළයුතුව ඇත. මේ සඳහා වැඩි බිම් වගා කිරීමට අවශ්‍ය ජලය ලබා ගත යුතු වන්නේ දැනට ඇති ජලය මනාව පාලනය කිරීමෙනි.

ලෝක ජල අවශ්‍යතා වලින් දෙවන තැන ගන්නේ කාර්මික ක්ෂේත්‍රයයි. කාර්මික රටවල ජල සැපයුමෙන් 80% ක් පමණ කර්මාන්ත සඳහා ප්‍රයෝජනයට ගැනේ. කාර්මික නිෂ්පාදනය වැඩිවත්ම ජලය අපිරිසිදු වීමද එපමණින්ම ඉහළ යන බව හෙළි වී ඇත. කාර්මික ක්ෂේත්‍රයට වසරකට ජල ඝන කිලෝ මීටර 630 ක් වැය වෙනවා.

පාරිභෝගික ජල සැපයුම සඳහා දැනට වසරකට යෙදවෙන්නේ ඝන කිලෝමීටර 150 කි.

ගොවිතැනට යොදා ගන්නා වාරි ජලයෙන් වැඩි හරියක් වාෂ්පීකරණය වෙනවා. කර්මාන්ත හා පාරිභෝජනයට ගන්නා ජලයෙන් සෑහෙන ප්‍රමාණයක් ආපසු ජල සැපයුම් ඒකකයන්ට එක් වෙනවා. මේ අනුව දැනට ලෝක ජනගහණය සඳහා වසරකට ඝන කිලෝ මීටර 2,600 ක් පමණ වැය වන අතර, 2,000 දී එය 6,000 වනු ඇතැයි ගණන් බලා ඇත.

**මහ ගංවතුරක් දෙගොඩ තලා යන අයුරින් ලොව සතර දෙසේම ජලය තිබුනත් අද ජලය මහත් ප්‍රශ්නයක් වෙලා. හැම අතින්ම ඉල්ලන්නේ ජලයයි. ලෝකයේ රටවල් වැඩි ගණනක ප්‍රශ්නයත් ජලයමයි. රට ඇතුළත මෙන්ම රට රටවල් අතරත් එය ප්‍රශ්නයක්. ඉන්දියාව හා බංගලිදේශය කදිම නිදසුනක්. වැඩියෙන් ඇත්තේ මුහුදු ජලය වුනත් තියෙන ජලය ටික නිසි ලෙස පාවිච්චි නොකර ප්‍රශ්නය වඩා බැරෑරුම් කරගෙන ඇත්තේත් මිනිසාමයි. කව වසර විස්සකින් ලොව පුරා සාගතයක් ඇතිවනු වළක්වන්න නම් ලෝක ආහාර නිෂ්පාදනය 50% කින් වැඩි කළයුතු බව ආහාර සංවිධානය කියනවා. වවන්න නම් වතුර ඕන. 2,000 වන විට මේ සඳහා ලෝක ජල සැපයුමෙන් 37% ක් වැය කරන්න වෙනවා.**

කාන්තාරයක මැදිවෙලා දිය බිඳක් සොයා යන්නෙකුගේ තත්ත්වයට අද ලෝකය පත්ව ඇතැයි කීවොත් එය මවා පෑමක් නොවෙයි. ඒත් මේ තත්ත්වය වළකන්න මිනිසා නොයෙකුත් පියවර ගන්නවා. ගන්න හදනවා. අන්න ඒවායින් අපට නිතර දෙවේල් අහන්න නොලැබෙන විස්තර ටිකකුයි පහත දැක්වෙන්නේ.

**ජල දූෂණය** – ඉස්සර ගමනක් බිමනක් ගිය මිනිස්සු දිය කඩිත්තකින් දෝතක් අරන් බිව්වේ සිසි සැකයකින් නෙවෙයි. දැන් එහෙමද? ගමේ ගොඩේ ඇල දෙලත් අපිරිසිදුයි.

දිය ඇලිවලට, ගංගා හා අවසානයේ මුහුදට අපිරිසිදු දේ රැගෙන යළි පිරිසිදු කිරීමේ හැකියාවක් තියෙනවා. ඒත් ඒකත් එක තරමකටයි. දැන් අපිරිසිදු දේ එක්වීම ඉහ වහා ගිහින්.

අපිරිසිදු ජලය මෙන්ම කුඹුරේ, ගොවිපලේ කෘමිනාශක, රෝහල්, කර්මාන්ත ශාලා හා ගෙදර දොර අපිරිසිදු දේද දැන් ස්වභාවික දිය ඇලි, ගංගාවලට රොක්ව ඒවා ප්‍රයෝජනයට ගැනීමට බැරි තත්ත්වයට පත්වෙලා. ලෝකයේ බොහෝ රටවල විල්, දිය ඇලි, ගංගාවල මාළුවෙක් සෙල්ලමටවත් දකින්න බැරි තත්ත්වයක් උදාවෙලා. ජීවයේ පදනම වන හැම ජල බිංදුවක්ම හැකිතරම් අපිරිසිදු නොකර සිටින්න යන්න දැන් ලෝකයේ සතර දෙසින්ම ඇසෙන අඳෝනාවක්.

**බීමට පිරිසිදු ජලය** – ලෝක ජනගහණයෙන් 70% කට බීමට පිරිසිදු ජලය ලැබෙන්නේ නැහැ. මෑතදී කල පරීක්ෂණයකට අනුව නොදියුණු රටවල් අටක ළදරු මරණ වලින් 90% ක්ම සිදුව ඇත්තේ අපිරිසිදු ජලයෙන්

බෝවූ රෝග නිසා. පසුගිය වසරේ පැවති ලෝක පරිසර සමුළුවේදී 1990 වනවිට ග්‍රාමීය හා නාගරික ජනතාවට පිරිසිදු ජලය ලබා දීමට කටයුතු සැළසුම් කිරීමට තිරණය වුනා.

බීමට ගන්නා වතුර මත සියල්ල රැඳෙන නිසායි මේ ගැන මෙසේ දැඩි අවධානයක් දක්වා ඇත්තේ.

**වාරිමාර්ග යෝජනා ක්‍රම-** නිකම් මුහුදට ගලා යන ජලය මිනිස් යහපතට යොදවන්න නොයෙකුත් ජල යෝජනා ක්‍රම ලොව පුරා ක්‍රියාත්මක වෙනවා.

අපිට මහවැලි වගේ, මිසරයට අස්වාන්, අප්‍රිකාවේ කරිබා, ගානාවේ වෝල්ටා නයිජීරියාවේ කේන්ජී මින් සමහරක්. ජලවිදුලිය, ගොවිතැනට වාරි ජලය සැප යීම මේ ක්‍රමවල ප්‍රධාන අරමුණු.

ඒත් මේවායේ අනිසි ප්‍රතිපලත් තියෙනවා. නව යෝජනා ක්‍රම නිසා භූගෝලාත්මක ස්වභාවික පැවැත්ම වෙනස්වීම එකක්. අනික ලෙඩ රෝග. අස්වාන් වේල්ල නිසා බැඳුනු නසාර් විලෙන් භයානක රෝග පැතිරිලා. බොහෝ අප්‍රිකානු රටවලත් මෙවැනි වසංගත රෝග ජලාශ්‍ර ඇසුරින් පැතිරිලා. මෙයත් අද ලෝකය ඉදිරියේ ඇති අභියෝගයක්ව තියෙනවා. මෙය වැලකීමට වාරි ජලයත් නල මගින් හෝ පොලොව යටින් යැවීම ගැන දැන් අදහස් කෙරෙනවා.

**කාන්තාර ජය ගැනීම –** ලෝකයේ බිම්වලින් තුනෙන් එකක් පමණ කාන්තාර නැතිනම් ඒ හා සමාන තත්ත්වයට පැමිණෙමින් තියෙන ඒවා. මෙම බිම් යළි වගා තත්ත්වයට ගෙන ඒම නැතිනම් කාන්තාර ජය ගැනීම ලෝකය ඉදිරියේ වන මහත් අභියෝගයක් බව එක්සත් ජාතීන්ගේ සංවිධානයත් පිළිඅරන්.

සුඩානය මෙහි ලා කදිම නිදසුනක්. එය කෘෂිකාර්මික රටක්. සත්ව පාලනය, වන විද්‍යා හා ධීවර අනෙකුත් ප්‍රධාන ජීවන වෘත්තීන්. එහෙත් රට තුළ බිම් කාන්තාර වීම මහ ප්‍රශ්නයක්. නයිල් නදී තීරයේ වගා බිම් පවා මේ තර්ජනයට ගොදුරු වන හැඩයි. අවුරුදු පහක කාන්තාර වළකන කටයුතු සඳහා ඩොලර් දශ ලක්ෂ 34 ක් සුඩානය වැය කරනවා.

මිසරය ගත වූ අවුරුදු විසි පහක කාලය තුළදී කාන්තාර බිම් හෙක්ටයාර 3,82, 655 යළි වගා බිම් කරගෙන. වියදම මිසර පවුම් කෝටි 40 යි.

එක්සත් ජාතීන්ගේ මෙහෙයවීමෙන් ලබන අගෝස්තු 29 වනදා නයිරෝබි නුවරදී කාන්තාර ජය ගැනීම පිළිබඳ මහ සමුළුවක් පැවැත්වෙනවා. මෙහි ලා ලෝක ව්‍යාප්ත වැඩපිළිවෙලක් සකස් කිරීම සමුළුවේ මූලික අරමුණයි.

**මුහුදු වතුර ගොවිතැනට –** ලෝකයේ වගා බිම් වලින් 10% ක් පමණ පසෙහි ලුණු ගතිය අධික වීම නිසා අත්හැර දමලා. දිනෙන් දින තත්ත්වය බරපතල වෙමින් තියෙනවා. විසඳුම ලෙස මෙතෙක් කළේ පසෙන් හා වාරි ජලයෙන් ලුණු ඉවත් කිරීමයි.

දැන් අළුත් විසඳුමක් ඇවිත්. මෙතෙක් කළේ බෝගවලට සුදුසු වන සේ පස හා ජලය සකස් කිරීමයි. ඇමරිකාවේ කැලිපෝනියා සරසවියේ අත්හද බැලීම් කරන දෙන්නෙක් දැන් ලුණු පසට සරිලන බෝග හදනවා. මුලින්ම මුහුදු වතුරින් බාර්ලි වගාවක් කරලා. මුහුදු වතුරට ඔරොත්තු දෙන බාර්ලි වර්ග එකොළහක් මුලින්ම වගා කරලා. විවිධ මට්ටම් වලින් ලුණු අඩංගු මුහුදු වතුර මේ සඳහා යොදගෙන. මෙම බාර්ලි අස්වැන්නෙන් ගත් ඇටවල ලුණු රසක් නොමැති සාමාන්‍ය ඒවා වීම ඔවුන්ගේ උද්දමයට හේතු වෙලා.

ඔවුන් දැන් තක්කාලි හා තිරිඟු වගාවන් අරඹලා. පසෙන් හා වතුරෙන් ලුණු

ඉවත් කරනවාට වඩා මෙම ක්‍රමය ප්‍රතිඵල ගෙන දිය හැකි බව විශ්වාස කරන ඔවුන් ළඟදීම වී හා කපු වගාවටත් මුහුදු වතුර යොදා ගන්න තීරණය කරලා.

**සාගර සම්පත් හා සාගර නීතිය**– පොළෝ තලයෙන් තුනෙන් දෙකක් පමණ වසාගෙන, ලෝක ජලයෙන් 96.5%ක් පමණ දරාගෙන සිටින මහා සාගරය මෙතෙක් මසුන් ඇල්ලීම හා නාවික ගමනාගමනයට පමණයි භාවිතා වුනේ.

මහා සාගරයේ මීට වඩා සම්පත් තියෙනවා. දැනටමත් ලෝකයේ ඛනිජ තෙල් වලින් 20% ක් පමණ මුහුදු පත්ලෙන් ලබා ගන්නේ. ඉතා අගනා ඛනිජ පවා දැන් සාගර පත්ලෙන් ගන්නවා. ටින්, තඹ, ඊයම්, තුත්තනාගම්, රිදී, රත්තරන්, කොබෝල්ට්, නිකල්, මැන්ගනීස් වැනි අගනා ඛනිජ මිළ කළ නොහැකි තරමින් සාගර පත්ලේ තිබෙන බව හෙළි වෙලා.

දියුණු රටවල් මේවා දැන් මුහුදු පත්ලෙන් ගන්නවා. 1967 එක්සත් ජාතීන්ගේ මහ සමුළුවේදී මෝල්ටා නියෝජිතයා සාගර සම්පත් 'මිනිස් සංහතියේ පොදු උරුමයක්' බව පවසා ඒවා සියළුම රටවලට බෙදී යා යුතු බව කිව්වා. එම අදහස අනුමත කරලා එක්සත් ජාතීන්ගේ සංවිධානය මෙම සම්පත් බෙදෙන අයුරු සකස් කරන්න සාගර නීති සමුළුවක් පවත්වනවා. ශ්‍රී ලංකාවේ ෂර්ලි අමරසිංහ මහතායි මෙහි සභාපති. මූලිකව මුහුද තීර ඇති රටවල් විසින් සැතපුම් දොළහක දේශ සීමාවකුත් සැතපුම් 200 ක ආර්ථික සීමාවකුත් දැන් පැනවිලා. ශ්‍රී ලංකාවත් ළඟදී මෙම සීමාවන් ප්‍රකාශයට පත්කළා.

හරිහැටි සාගර සම්පත් පරිහරණය හා බෙද ගන්නා අයුරු සාගර සමුළුව මේ වසරේ තීරණය කරනු ඇතැයි විශ්වාස කරනවා.

එහෙත් මුහුදෙන් මිනිසාට ගත හැකි මහඟු සම්පත ලෙස තවමත් සළකනුයේ මාළු. දැනට මාළු වලින් ගන්නා ජීව පදර්ථ ප්‍රමාණය 13% යි. මෙය 65% දක්වා වැඩි කිරීමට හැකියි. දැනට මිනිස් ආහාරයට ගන්නා ජනප්‍රිය මාළු වර්ග 55 යි. එහෙත් අපේ ආහාර රටාව වෙනස් කළහොත් මේ සඳහා ගත හැකි මාළු ජාතීන් 30,000 ටත් 40,000 ටත් අතර ප්‍රමාණයක් සාගරයේ ඉන්නවා.

## ලෝක ජලසමුළුව

- ලෝකයේ මිරිදියෙන් හතරෙන් තුනක් උතුරු හා දකුණු ධ්‍රැවවල හා හිම ශිඛර වලයි ඇත්තේ.
- මිරිදිය ඉතිරියෙන් තවත් 22% ක් පොළොව යටයි. මින් ඉතා සුළු ප්‍රමාණයයි මිනිස් පාවිච්චිය සඳහා ගත හැක්කේ.
- මිරිදිය ප්‍රමාණයෙන් දිය ඇලි, විල්, ගංගා හා ජලාශවල තිබෙන 1% ජල ප්‍රමාණයයි මිනිස් දිවියට ප්‍රයෝජන වන්නේ. මෙය රැක ගැනීම ඉතා වැදගත්.

එහෙත් අද තත්ත්වය කුමක්ද? ගොවිතැන් හා වාරිමාර්ග සඳහා අවශ්‍ය තරමට වඩා ජලය ගන්නවා. කම්හල් වලින් අපවිත්‍ර කරන ජල ප්‍රමාණය අති මහත්. බොහෝ නාගරික ජල සැපයුම් වලින් අපතේ යන ජල ප්‍රමාණය සුළු නොවේ. ජල හිඟය මෙන්ම ජලය වැඩිපුර ගැනීමත් අද ප්‍රශ්නයේ එක් පැත්තක්.

ලෝකයේ ජල සම්පත් ප්‍රමාණය ස්ථිර එකක් නිසා මෙය රැක ගැනීම අත්‍යවශ්‍යම දෙයක්. ගොවිතැනට හා කර්මාන්තවලට වැඩි ජලයක් අවශ්‍යයි. තිබෙන ජලයෙන් මෙය සැපයිය නොහැකිව ඇත්තේ ජල දූෂණය නිසායි.

ලෝක ජල ප්‍රශ්නයට පිළිතුරු එනම් වැඩිපුර අවශ්‍ය වන ජලය සැපයිය හැකි වන්නේ ජලය රැක ගැනීමෙන්. ජල සංරක්ෂණයෙන්.

මෙහිලා මිනිස් සංහතිය තුළ අවබෝධයක් ඇති කරවීමයි ලෝක ජල සමුළුවේ බලාපොරොත්තුව වුනේ. ලෝකයේ රටවල ආණ්ඩු මගින් ජල ප්‍රතිපත්ති සකස් කරවීම තව එකක්.

පසුගිය මාර්තු මස ආර්ජන්ටයිනාවේ පැවැති ජල සමුළුව මෙහිලා අවශ්‍ය සැළැස්ම පිළියෙල කරලා. එහි තීරණ කුමක් වුනත් ජලය පිළිබඳව මිනිසුන් තුළ මීට වඩා අවබෝධයක් නැතිනම් අනුකම්පාවක් ඇති කිරීම එහි ප්‍රධාන පරමාර්ථයයි.

## ලෝක ජලධාරිතාව

(ඝන කිලෝ මීටර වලින්)

| වර්ග | පරිමාව | ලෝක ජලයෙන් % | මිරිදියෙන් % |
|---|---|---|---|
| මුහුදු වතුර | 1338000000 | 96.5 | — |
| භූගත ජලය | 23400000 | 1.7 | — |
| මිරිදිය | 10530000 | 0.76 | 30.1 |
| පොලෝ තෙතමනය | 16500 | 0.001 | 0.05 |
| හිම ශිඛර හා හිම | 24064100 | 1.74 | 68.7 |
| නුහින කලාපභූගත | 300000 | 0.022 | 0.86 |
| මිරිදිය විල් | 91000 | 0.007 | 0.26 |
| වගුරු | 11470 | 0.0008 | 0.03 |
| දිය ඇලි | 2120 | 0.0002 | 0.006 |
| වාතයේ | 12900 | 0.001 | 0.04 |
| ජීවි ජලය | 1120 | 0.0001 | 0.003 |

1. මුහුදු ජලය
2. ගොඩබිම හා වාතයේ මිරිදිය
3. මිදුණු ජලය







1. භූගත ජලය සැතපුම් ½ ගැඹුරින්
2. භූගත ජලය සැතපුම් ½ පහළ
3. වාතයේ වාෂ්ප
4. ගංගා, වැව් හා දියඇලි
5. පොලෝ තෙතමන හා කාන්දුවීම

## රටරටවල ජල පාවිච්චිය

සිංගප්පූරුව හා කැනඩාව තම ජනතාවට ඉතා පිරිසිදු ජලය ගෙදර දෙර කටයුතුවලට දෙන රටවල් දෙකක්. ඉතා පිරිසිදු ජලය පාවිච්චිය වැඩිවත්ම ජලය ඇසුරෙන් හැදෙන ලෙඩරෝග අඩු වන බව මින් පැහැදිලි වෙලා. රටවල් කිහිපයක පුද්ගලයින් දින පතා පාවිච්චි කරන ජල ප්‍රමාණයන් මෙසේයි.

| රට | ජල ලීටර |
|---|---|
| ඉන්දියාව | 50 |
| තායිලන්තය | 50 |
| ටැන්සානියාව | 50 |
| එංගලන්තය | 150 |
| ප්‍රංශය | 200 |
| ස්වීඩනය | 200 |
| රුසියාව | 200 |
| ඇමරිකාව | 630 |

උසස් තත්ත්වයේ ජල ලීටර 90 ක් අඩුම මට්ටමේ සමාජ අවශ්‍යතාවය බව සිංගප් පූරුවේ දස අවුරුදු අධ්‍යයනයක් වාර්තා කළා.

## ජපනෙකුට වතුර කිලෝ 831

ජපානය වසරකට වතුර ටොන් කෝටි 50 ක් ආහාර නිෂ්පාදනයට වැය කරනවා. සාමාන්‍ය ආහාර වේලට ඇතුළත් වන ආහාර ග්‍රෑම් එකක් නිෂ්පාදනයට වැය වන ජල ප්‍රමාණය (ග්‍රෑම් වලින්) මෙසේයි:

| | |
|---|---|
| ධාන්‍ය | 800 |
| එළවළු | 200 |
| පළතුරු | 400 |
| බිත්තර | 470 |
| කිරි | 470 |
| මස් | 4,000 |

සාමාන්‍ය නිරෝගී ජපන් ජාතිකයකුගේ දිනක ආහාර අනුභවය ග්‍රෑම් වලින් මෙසේයි:

| | |
|---|---|
| ධාන්‍ය | 380 |
| එළවළු | 650 |
| පළතුරු | 120 |
| මස් | 35 |
| බිත්තර | 30 |
| කිරි හා මාළු | 120 |

මේ අනුව ජපන් ජාතිකයෙකුගේ දිනක ආහාර වලට වතුර කිලෝ ග්‍රෑම් 830 ක් යනවා. ඒත් එයා දිනකට බොන්නේ වතුර කිලෝ ග්‍රෑම් 1 යි.

ජපනුන්ගේ ජනප්‍රියම ආහාරය මාළුය. ඊට අමතර ජලය අවශ්‍ය නැහැ. මේ නිසා ඔවුනට සෙසු කටයුතු සඳහා ජල ඉතිරියක් ලැබෙනවා. මේ ආහාර වේල සඳහා ඇමරිකාවේ මේ වගේ සතර ගුණයක් ජලය වැය වෙනවා.

# ජලය - ඔබේ අයිතිය සහ ඔබේ යුතුකම්

ශ්‍රී ලංකාවේ ජල සම්පතද නීතියේ රැකවරණ ලැබූවක්. ජල සම්පත ප්‍රයෝජනයට ගැනීමේ ලා ජනතාවට ලැබී ඇති ඉඩ මෙන්ම ජනතාවගෙන් විය යුතු යුතුකම් මොනවාද?

පොදු දිය පාරක, වැවක හෝ පොකුණක ඉවුරු ඉඩම්වල පදිංචි අයට පහත දැක්වෙන කරුණු සඳහා ජලය ලබා ගැනීමට අවසර ඇත.

(අ) ගෙදර දොර කටයුතු සඳහා;

(ආ) හරක් හෝ වෙනත් සත්ව පාලන කටයුතු සඳහා;

(ඇ) ගොවිතැන් කටයුතු සඳහා;

බලධාරීන්ගෙන් විශේෂ අවසර ලබා නොමැති නම් මෙම කටයුතු සඳහා ඔබට ජලය ගත හැකි වන්නේ බාල්දියක් හෝ එවැනි භාජනයකින් පමණි. දිය අගල්, කානු හෝ ජල නලයක් මගින් හෝ වෙනත් යාන්ත්‍රික උපකරණයක් මගින් එම කටයුතු සඳහා ජලය ගැනීම නීති විරෝධී ක්‍රියාවකි.

මේ හැර දිසාපතිගේ හෝ බලතල ඇති වෙනත් නිලධාරියෙකුගේ අවසරයක් නොමැතිව ජලාශ්‍ර ආශ්‍රයෙන්

(අ) කිසිදු ඇල වේල්ලක් බැඳීම, අගලක් හෝ කාණුවක් කැපීම හෝ පවත්වාගෙන යෑම;

(ආ) යාන්ත්‍රික උපකරණ භාවිතය;

(ඇ) දිය පාරක හෝ වැවක් තුළ හෝ හරහා පාලමක් තැනීම;

(ඈ) දිය පාරක් හෝ වැවක් අපිරිසිදු කිරීම හා ඒවාට බාධා කිරීම හා

(ඉ) තමාට සාධාරණව හිමි තරමට වඩා ජලය ගැනීම නීති විරෝධිය.

මෙම නීති රීති කඩන්නෙකුට රුපියල් පන්සියයක දඩයක් හෝ හය මසක හිර දඬුවමක් හෝ මෙම දඬුවම් දෙකම පැනවිය හැක. මේ හැර මොනම ආකාරයකින්වත්, දිය පාරක්, ඇලක්, පොකුණක්, වැවක් හා සෙසු ජලාශයක් අපවිත්‍ර කිරීම දඬුවම් දිය හැකි වරදකි. මේ සඳහා දඩය රුපියල් පනහකි.

නීතිය මෙහෙම වුනත් දිය පාර, ජලාශ ජලය පිළිබඳව අප තුළ කිසිම තැකීමක් හැඟීමක් නැති බව රට පුරා දිනපතාම කෙරෙන දේ වලින් පැහැදිලි වෙනවා. සමහරක් නොදැනුවත්කම නිසා. බොහෝවිට නොසැළකිලිමත්කම නිසා.

සෑම දිය උල්පතක්ම දිය පාරක, වැවක හෝ ගඟක ආරම්භයක් වන නිසා එය ජාතික වස්තුවක් ලෙස රැක ගැනීම ගැන උනන්දු වන්න. අන් අයටත් කරුණු අවබෝධ කර දෙන්න. එය නීතියට අනුකූල වනවාටත් වඩා ජාතික ධනයක් රැක ගැනීමක්. දන් අපේ ජල සම්පතට අවශ්‍ය ජනතාවගේ රැකවරණ යයි.

## පුරාණ නීති

'කුඹුර (ගොයම්) කපා නව දිනකින් මොහොල් (ජලය පාලනය කරන උපකරණ) ඔබවා රජ සොරොව්ව ඉදිරියෙහි සතර රියනක් දිය යට හිඳුවන ලද දියකඩ පහණ (පිට කරනු ලබන ජල ප්‍රමාණය කරන) ගල් මුදුන පෙනෙන තෙක් අවුලක් නැතිව දිය පැවැත්වීම..............'

වෙස්සගිරිය සෙල් ලිපිය.

'ජලයෙන් කුඹුරු යට කිරීමේ වරදට අක දෙකක් ගැනීම (කොට) ද, (සිවු) සී සෑම පිළිබඳ වරදකට රන් කලඳක් ගැනීම (කොට) ද, යල් පැන (පසු වී) සිදු කළ සී සෑම (වැපිරීම) පිළිබඳ වරදකට පස් කළඳක් රන් ගැනීම (කොට) ද, ...........'

කොන්ඩවට්ටවාන් වැව් ලිපිය.